**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව සතු නොවූ අක්කර 19 ක් වූ රු.11,400,000 ක් වටිනා ඉඩමක් ගිණුම්ගතකර තිබූ අතර, රු.19,376,591 ක් වටිනා ඉඩම් 35 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | ඉඩම් හා ගොඩනැගිලි ප්‍රාග්ධනිත කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී සභාව සතුවූ ගොඩනැගිලි සංවර්ධනය සඳහා දරා තිබුණු රු.4,317,228 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට අතපසු වූ ගොඩනැගිලි වටිනාකම ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ඉඩම් 01 ක වටිනාකම රු.90,000 ක් අඩුවෙන්ද ඉඩම් 04 ක වටිනාකම රු.1,799,000 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවීමට නොතිබූ රු.18,998,252 ක ශේෂයක් සැපයුම් ණයහිමි ලෙස ගිණුම්ගතකර තිබූ අතර, රු.800,000 ක් වටිනාකම වූ කර්මාන්ත ණයහිමි ශේෂ 02 ක් ගිණුම් වලින් මඟහැරී තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු රු.308,920ක් ගිණුම්ගතකර නොතිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු.557,154 ක් අඩුවෙන්ද, වර්ෂය අවසානයේ ස්ථාවර තැන්පත්වල වටිනාකම රු.663,514ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට ගෙවිය යුතු වටිනාකම රු.149,825 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේ දී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තුව වියදමක් ලෙස ගිණුම්ගතකර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන නොකිරීමේ අඩුපාඩුව නිවැරදි කරමි. | |

**1.7** **අනුකූල නොවීම්**

-------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

----------------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 නොවැම්බර් 02 දිනැති අංක 2015/01 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | | |
| • 03 (i) ඡේදය | ආගමික ස්ථානවල යම් ඉදිකිරීමක් සඳහා ද්‍රව්‍ය හා මුදල් ආධාර ලබාදීමේ දී රු.20,000ක උපරිම සීමාවකට විය යුතු වුවත්, එම සීමාව ඉක්මවා අවස්ථා 07 කදී පන්සල් 27 කට රු.700,000 ක මුදලක් ඉදිකිරීම් සඳහා ආධාර ලබාදී තිබුණි. | ප්‍රදේශයේ මහජන නියෝජිතයා විසින් එම මුදල ප්‍රමාණවත් නොවන හෙයින් වෙන් කරන ලද ප්‍රතිපාදනය එම ආගමික ස්ථානයට මූල්‍යමය වශයෙන් ආධාර කරනු ලබයි. | චක්‍රලේඛවල දක්වා ඇති සීමා තුල කටයුතු කළ යුතු වේ. |
| • 08 (ඊ) (i) ඡේදය | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව හා ස්වෙච්ඡා සංවිධාන සඳහා ආධාර ලබාදීමේ දී රු.15,000 ක උපරිමයකට යටත්ව ආධාර ලබාදිය හැකි වුවත්, එම උපදෙස් අනුගමනය නොකර සමිති 10 කට රු.350,000 ක ආධාර ලබාදී තිබුණි. | සමිති සමාගම් සඳහා අදාළ භාණ්ඩ මිලදී ගැනීමට වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බැවින් එම අඩුපාඩුව සමිතියෙන් දරා ගැනීම සඳහා ප්‍රතිපාදනය සමිතිය වෙත ලබා දෙනු ලබයි. | චක්‍රලේඛවල දක්වා ඇති සීමා තුල කටයුතු කළ යුතු අතර, අඩුපාඩු මුදල සමිතියෙන් ලබාගෙන ප්‍රසම්පාදනය කර භාණ්ඩ ලබාදීමට කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.98,499,491 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,657,500 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 7,971 කින් වරිපනම් හිඟ ශේෂය 15,836,483 ක් විය. මෙම හිඟ මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | විශේෂයෙන්ම ආදායම් පරීක්ෂක තනතුරු 04 ක පුරප්පාඩු වී පැවතීම, පවතින ආර්ථික අර්බුදය, පැවැති කොරෝනා වසංගත තත්ත්වය යන හේතු මත ක්ෂේත්‍ර ආදායම් රැස් කිරීම් කටයුතු අඩාල විය. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග යොදාගෙන හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ බදුදුන් මස්කඩ 04 කින් 2021 නොවැම්බර් 30 දිනට රු.420,650 ක බදු මුදලක් අයවීමට පැවතුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | වත්කම් බදු දීමේ දී ඒ ඒ වර්ෂයේ දී හිඟයකින් තොරව ආදායම ලබාගත යුතු වේ. |
| | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භයට පැවති රු.727,000 ක ව්‍යාපාර බදු ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වර්ෂයේ ආරම්භයේ ඇති හිඟ අයකරගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුරනැගුම ව්‍යාපෘතියෙන්, දේශීය ණය සංවර්ධන අරමුදලින් හා සභා අරමුදල් මගින් රු.159,251,130 ක මුදලක් වැයකර කඩ කාමර 52 කින් යුතු පොදු වෙළඳපලක් ඉදිකර 2015 වර්ෂයේ සභාවට භාර දී ඇතත්, මෙම දේපල බදු දී ආදායම උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රටෙහි වර්තමාන තත්ත්වය තුළ පවතින අනපේක්ෂිත තත්ත්වය හමුවේ පොදු වෙළඳපල විවෘත කිරීම් කටයුතු කර ගැනීමේ අපහසුතාවයක් පවතී. විවෘත කිරීමට ලැබෙන පළමු අවස්ථාවේ දීම විවෘත කර කඩ හිමියන් හට ලබා දී අපේක්ෂිත ආදායම් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | පොදු වෙළඳපල වැඩ නිමවූ පසු සංකීර්ණය විවෘත කර බදු දීමට කටයුතු කර ආදායම් ඉපයීම මෙන්ම ජනතාවට සේවාව ලබාදිය යුතු වේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බන්දාව එළහරක් මස් කඩය සභාව විසින් බද්දට ගෙන ටෙන්ඩර් කැඳවා බදු දීමට කටයුතු නොකර ටෙන්ඩර් කිරීමකින් තොරව ගොඩනැගිල්ලේ හිමිකරුට මස් විකිණීමේ අයිතිය වාර්ෂිකව රු.594,485ක මුදලකට ලබාදී තිබුණි. | මෙම මස්කඩය දිගින් දිගටම බදු ලබාගෙන ඇත්තේ ඉඩමේ හිමිකරු විසින්ය. මෙම ස්ථානය සභාවට බදු පවරාගෙන ඇති අතර මෙහිදී කිසිදු මුදල් ගනුදෙනුවක් සිදුකර නොමැත. හුදෙක් මෙම ස්ථානය සභාව මගින් බදු ලබාගෙන ඇත්තේ ඔහු සමඟ ඇති කරගන්නා ගිවිසුමේ නීත්‍යානුකූල භාවය ආරක්ෂාකර ගැනීමට බව දන්වමි. | මස් විකිණීමේ අයිතිය සභාව සතුය. ඒ අනුව මස්කඩ පිහිටි ගොඩනැගිල්ල බදුගෙන මස් විකිණීමේ අයිතිය බදුදිය යුතුය. |
| (ආ) | සභාව සතු බස්නැවතුම්පල ආපනශාලාව 2007 වර්ෂයේ රු.7,000 කට තක්සේරු කර තිබූ අතර, එම කඩ කාමරයෙන් 2018 දෙසැම්බර් 31 දිනවන විට රු.1,076,859 ක හිඟ ශේෂයක් පැවතුනද, මෙම හිඟ මුදල අයකිරීමට කටයුතු කර නොතිබුණි. 2018 දෙසැම්බර් සිට මෙම කඩ කාමරයේ බිල්කිරීම නතරකර තිබීම මත 2019 සිට 2021 දක්වා සභාවට රු.252,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | මේ සම්බන්ධයෙන් නඩුවක් පවතින බව දන්වමි. | සභාව සතු වත්කම් බදු දීමට කටයුතු කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගත යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොල්ගහවෙල මහජන ක්‍රීඩාංගණය සභාව සතු නිශ්චල දේපලක් ලෙස භාවිතා කර භුක්ති විඳිමින් පැවතුණ ද නිරවුල් අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ගුවන් පාලමක් ඉදිකිරීම වෙනුවෙන් මෙම මහජන පොදු ක්‍රීඩාංගණයේ කොටසක් රජයට පවරාගෙන තිබුණි. මෙම දේපල සඳහා වන්දි මුදල් ලෙස රුපියල් කෝටි 2ක මුදලක් අනුමත වී ඇතත්, මෙම දේපල හිමිකම පිළිබඳ තහවුරු කිරීමට ලේඛන හා ලියවිලි නොමැති වීමත්, මෙම ක්‍රීඩාංගණ ඉඩම් සඳහා වෙනත් පුද්ගලයකු ඉදිරිපත් වී ඇති බැවින් ක්‍රීඩාංගනයේ නිරවුල් අයිතිය සභාවට නොමැතිවීම හේතුවෙන් වන්දි මුදල් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ගුවන් පාලම ඉදිකිරීම සඳහා මහජන ක්‍රීඩාංගණයේ කොටසක් රජයට පවරා ගැනීම, ඒ සඳහා වන්දි මුදල් අනුමත වුවත් එකී දේපල හිමිකම් පිලිබද තහවුරු කිරීමට ලේඛන නොමැති වීම මත වෙනත් බාහිර පුද්ගලයෙකු මෙම ඉඩම් කැබලි සඳහා ඉදිරිපත් වීම හේතුවෙන් නියම හිමිකරු හඳුනා ගැනීම හා නිරවුල් කිරීම මූලික කර ගෙන ප්‍රාදේශීය ලේකම් විසින් දිසා අධිකරණයේ මේ වන විට නඩුවක් ගොනු කර ඇත. | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබා ගැනීමට බලධාරීන් කටයුතු කළ යුතු වේ. |

## 3.4 දෘශ්‍ය අක්‍රමිකතා

-----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගනේගොඩ වත්ත පොදු ඉඩමේ කැබලි අංක 8 ඒ දරණ පර්චස් 48 ක කොටසේ පුද්ගලයෙක් නිවසක් ඉදිකරගෙන පදිංචි වී සිටින බව භෞතිකව සිදුකල විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. මෙම ඉඩම සභාව භාරයට ගෙන වෙන්දේසි ඉඩමේ පදිංචි අයගේ පොදු කටයුතු සඳහා ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පොදු කටයුතු සඳහා පදිංචිකරුවන් විසින් කිසිදු ඉල්ලීමක් සිදුකර නොතිබිණි. මෙම ඉඩමේ කොටස් 02 ක තවදුරටත් සභාව භාරයේ පවතී. | පොදු කටයුතු සඳහා ලැබී ඇති ඉඩම් ආරක්ෂා කර ගැනීමට සභාවේ බලධාරීන් කටයුතු කළ යුතුය. මෙම ඉඩමේ පර්චස් 48 ක කොටසක පුද්ගලයෙකු අනවසරයෙන් පදිංචි වී ඇත. එය ඉවත් කළ යුතු වේ. |
| (ආ) | ගොඩවෙල බටගොල්ල වෙන්දේසි ඉඩමෙන් පොදු කටයුතු සඳහා වෙන්කල ඉඩම් ප්‍රමාණය පර්චස් 77 ක් වෙනුවෙන් ලොට් අංක 15, 16, 17, 18, 19 යන කැබලි ප්‍රාදේශීය සභාවට පොදු කටයුතු සඳහා පවරාදෙන ලෙස දන්වා කට්ටි සැලැස්ම අනුමත කර ඇතත්, ප්‍රාදේශීය සභාවට ඔප්පුවක් මඟින් පැවරූ බවට සාක්ෂි ලිපිගොනුවේ නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ප්‍රාදේශීය සභාව සතු විය යුතු පොදු ඉඩම් කොටස කට්ටි සැලැස්මේ සඳහන්ව ඇතත් ඔප්පු මඟින් සභාව වෙත පැවරූ බවක් ලිපිගොනුවේ සඳහන්ව නොමැත. | ලිපිගොනුව අනුව පර්චස් 77ක් පොදු කටයුතු සඳහා ලබා ගැනීමට කටයුතු නොකල නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගතයුතු වේ. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සභා අරමුදල් මගින් ගොඩිගමුව පැති බැම්ම ඉදිකිරීම සඳහා රු.606,824 ක මුදලක් වැයකර වැඩ නිමකර තිබුණි. කුඹුරක අදාළ කුඹුරු ඉඩම් හිමියන්ගෙන් පවරා ගැනීමකින් තොරව මෙම ඉදිකිරීම් සිදුකර තිබුණි. මෙහි පාදම ස්ථාවර නොවීම හේතුකොටගෙන මෙම කඩා වැටීම සිදුවී තිබූ බවද මෙහිදී නිසි අධීක්ෂණයක් හා තාක්ෂණය භාවිතා කර නොතිබුණි. සභාවට රු.606,824 ක අලාභයක් සිදුවී ඇතත් මෙම අලාභය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නොතිබුණි. | අධික ගංවතුර තත්ත්වය බැම්මට ඔරොත්තු නොදීම හේතුවෙන් බැම්ම පෙරළී ඇත. ඉදිකිරීමෙන් මාස 06ක් පමණ එනම් ගංවතුරට හසුවන තුරුම කිසිදු ආපදාවකින් තොරව පැවතුණි. සැලසුම් කල ආකාරයටම කුඹුරු මට්ටමේ සිට 750mm ගැඹුරට අත්තිවාරම කැපූ අතර ඉතා කුඩා අඩුවැඩි වීම සිදු වීම පිළිගත හැකිය. | කුඹුරක ඉදිකිරීමක් සිදුකරන විට නියමිත ප්‍රමිතියට කළ යුතු වේ. බැම්ම සම්පූර්ණයෙන් පෙරළී ඇති බැවින් බැම්ම ගුණාත්මක බවින් තොරව ඉදිකර ඇත. මෙහි අලාභය අදාල නිලධාරින්ගෙන් අයකළ යුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේ සභා අරමුදල් මගින් බන්දාව ඉන්ධන පිරවුම්හල අසලින් යන පාර තාරදමා සකස් කිරීම සඳහා රු.297,403 ක මුදලක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකල ලිපිගොනු හා භෞතික පරීක්ෂාවේ දී සභා අරමුදල් යොදවා ව්‍යාපෘති සිදු කිරීමේ දී වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයකට ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති තෝරාගත යුතු වුවත්, මෙම ව්‍යාපෘතිය ඉටුකර තිබුණේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීවරියකගේ පෞද්ගලික නිවසකට යන මාර්ගයක් සංවර්ධනය සඳහා බව නිරීක්ෂණය විය. | මෙම මාර්ගය ගරු මන්ත්‍රීතුමියගේ ඉල්ලීම පරිදි 2021 අප්‍රේල් 05 වන දින පැවති සංවර්ධන කාරක සභාවේ අනුමැතිය පරිදි තාර දමා සංවර්ධනය කරන ලදී. මෙය මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ යෝජනා වී අනුමත වූ ව්‍යාපෘතියක් වන අතර මේ පිළිබඳ මහ සභාව දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | සභා අරමුදල් යොදවා ව්‍යාපෘති ඉටු කිරීමේ දී වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයකට ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘති තෝරාගැනීම සිදුකල යුතු වේ. |
| (ඇ) | 2013 වර්ෂයේ ගලබඩගම සුසාන භූමිය සඳහා පැති බැම්මක් ඉදිකර රු.523,323 ක් ගෙවීම් සිදුකර තිබුණි. මෙම ඉදිකිරීම සම්බන්ධයෙන් 2022 මාර්තු 10 දින භෞතික පරීක්ෂාවේ දී බැම්ම පෙරලී හානි වී තිබුණි. ප්‍රමිතියකින් තොරව සිදුකල ඉදිකිරීම් හේතුවෙන් මෙම හානිය සිදුවී තිබූ බව නිරීක්ෂණය විය. | 2021 මැයි 13 හා 14 යන දිනවල පැවැති ධාරානිපාත වර්ෂාව හේතුවෙන් මෙම බැම්ම මැද කොටසින් ජල පීඩනය නිසා ජලය ගමන් කිරීම මගින් පොළවෙන් උඩ කොටස කැඩී ඇත. බැම්ම පෙරළී යාමට හේතුව ප්‍රමිතියකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම නොව අධික වර්ෂාව බව පෙන්වා දෙමි. | ප්‍රමිතියකට අනුව ඉදිකිරීම් සිදු කළ යුතු වේ. |